අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 04 /2010 මගේ අංකය : 2/6/4/1 TT (Vol.III)

2010. 12. 29

වන සංරක්ෂක ජනරාල්
ඉඩම් කොමසාරිස් ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
සභාපති/රාජ්‍ය දැව සංස්ථාව
සියළුම දිස්ත්‍රික් ලේකම්වරු
සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

**දීමනා පත්‍ර/ දීර්ඝ කාලීන බදු සහ බලපත්‍ර යටතේ අන්සතු කළ රජයේ ඉඩම් වල හා වෙනත් රජයේ ඉඩම් වල ගස් හෙලීමට හා ඉවත් කිරීමට අවසර දීම**

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කරන ලද රජයේ ඉඩම් වල හා අනෙකුත් රජයේ ඉඩම්වල දැව හෙලීම හා ඉවත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ලිපි ද එම චක්‍රලේඛ වලට කර ඇති සංශෝධන ද පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා අදාල අනෙකුත් ආයතන විසින් සමාලෝචනය කිරීමෙන් පසුව මේ චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමගම පහත සඳහන් සියළු චක්‍රලේඛ හා ලිපි අවලංගු වන බව සැලකුව මැනවි.

I. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අංක : 02/223 හා 1988 ජූලි 14 දිනැති " ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කළ ඉඩම් වල දැව හෙලීම හා ඉවත් කිරීම " මැයෙන් දිසාපතිවරුන් වෙත නිකුත් කල චක්‍රලේඛය.

ii. ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ අංක : 06/02/5 හා 1989.08.09 දිනැති "ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කළ ඉඩම් වල දැව හෙලීම හා ඉවත් කිරීම" මැයෙන් දිසාපතිවරුන් වෙත නිකුත් කල ලිපිය.

iii. ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ අංක: 06/02/5 හා 1990.01.02 දිනැති "ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කළ ඉඩම් වල දැව හෙලීම හා ඉවත් කිරීම" මැයෙන් දිසාපතිවරුන් වෙත නිකුත් කල ලිපිය.

iv. ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ අංක: 06/02/5 හා 1993.06.10 දිනැති "ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කළ ඉඩම් වල දැව හෙලීම හා ඉවත් කිරීම" යන මැයෙන් යුතු සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කල ලිපිය.

v. වන සම්පත්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ අංක: 06/02/5 හා 1993.11.18 දිනැති "ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කරන ලද ඉඩම් වල දැව හෙලීම හා ඉවත් කිරීම" මැයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්, අඩවි වන නිලධාරීවරුන් හා කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ කළමනාකරුවන් වෙත නිකුත් කල ලිපිය.

vi. කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ අංක: 06/02/5 වෙළුම III හා 1996.12.06 දිනැති "බලපත්‍ර යටතේ අන්සතු කළ රජයේ ඉඩම් වල හා වෙනත් රජයේ ඉඩම් වල ගස් හෙලීමට හා ඉවත් කිරීමට අවසර දීම" මැයෙන් ප්‍රාදේශිය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරු, වන සංරක්ෂක ජනරාල්, සභාපති/රාජ්‍ය දැව සංස්ථාව, මිනුම්පති වෙත නිකුත් කල අංක: 18/96 දරණ චක්‍රලේඛය

vii. වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ අංක: 2/2/6/654 හා 1998.10.20 දිනැති ' දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම' මැයෙන් ප්‍රාදේශිය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරු, වන සංරක්ෂක වෙත නිකුත් කල අංක : 8/98 දරණ චක්‍රලේඛය

viii. වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ අංක: 02/02/06/610 හා 1999.07.27 දිනැති "දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම' මැයෙන් ප්‍රාදේශිය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරු, වන සංරක්ෂක වෙත නිකුත් කල අංක: 4/99 දරණ චක්‍රලේඛය

## 02. රජය විසින් අලුතින් ඉඩම් බෙදාදීමට පෙර එම ඉඩම්වල ගස් ඉවත් කිරීම.

2.1 ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යන පනත් යටතේ අළුතින් ඉඩම් බෙදා දීමට පෙර එම ඉඩම්වල පිහිටීම පිළිබඳ විස්තර දන්වා එම ඉඩම් වල ඉවත්කළ යුතු යැයි හැඟෙන වානිජමය වටිනාකමින් යුත් ගස් නියමිත කාලයක් තුල ඉවත් කර ගන්නා ලෙස රාජ්‍ය දැව සංස්ථාව වෙත ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ලිඛිතව උපදෙස් දිය යුතුය. ඒ අනුව ගස් ඉවත් කිරීමට අවශ්‍ය විධිවිධාන අප්‍රමාදව යොදා ගස් සියල්ල ඉවත් කොට අවසාන බවට රාජ්‍ය දැව සංස්ථාව වෙතින් ලිඛිත සහතිකයක් ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත නිකුත් කළ යුතුය. ඉඩම බෙදාදීමට පෙර ඉඩම තුල ස්වාභාවයෙන්ම වැවී ඇති හා රජය විසින් වවන ලද එහෙත් ආර්ථික වටිනාකමක් නොමැති සියළු ගස් ලැයිස්තුවක් ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී/ක්ෂේත්‍ර උපදේශක/ග්‍රාම නිලධාරී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහ පරිසර නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් පිළියෙල කර එම ලැයිස්තුව ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත භාර ගත යුතු අතර ඉඩම් අන්සතු කළ යුත්තේ ගස් ඉවත් කිරීමෙන් පසුවය.

2.2 මෙම ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පෙර වානිජ වටිනාකමක් නොමැති ගස් පිළිබඳ විස්තරයක් බලපත්‍රයට හා ලෙජරයට ඇතුලත් කොට එම ගස් ප්‍රාදේශීය ලේකම් /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ අනුමැතියක් නොමැතිව ඉඩමෙන් ඉවත් කිරීම තහනම් කෙරෙන කොන්දේසියක් බලපත්‍රයට ඇතුලත් කල යුතුය.

2.3 අනෙකුත් සංවර්ධන කාර්යයන් සඳහා තෝරා ගන්නා රජයේ ඉඩම්වල ගස් ඉවත්කිරීමට පෙර රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද යෝජනා ක්‍රමය භාර ආයතනයේ නිලධාරීන් ද, මිනුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද එක්වී මුදාහැරීමට යෝජිත ඉඩම්වල මායිම් ලකුණු කළ පසු වන සංරක්ෂණ නිලධාරීන් විසින් එම ගස් අංකනය කර ලැයිස්තුවක් පිළියෙළ කර රාජ්‍ය දැව සංස්ථාව වෙත භාර දිය යුතුය. රාජ්‍ය දැව සංස්ථාව ගස් හෙලීමට අදාල භූමියට පිවිසිය යුත්තේ හෝ ඒ සඳහා අවශ්‍යවන්නේ නම් කොන්ත්‍රාත්කරුවන් ඇතුළු කළ යුත්තේ ඉන් පසුව පමණි. මායිම් ලකුණු කිරීමෙන් පසු ගස් හෙලීම ආරම්භ කළ අවස්ථාවේ සිටම රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සම්පව අධීක්ෂණය කළ යුතුය. ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට හා වන සංරක්ෂණ නිලධාරින්ට ද විටින්විට මෙම හෙලීම් පරීක්ෂා කළ හැකිය. යම් හෙයකින් ලකුණු කොට ඇති සීමාවන් ඉක්මවා ගස් හෙලීම් කරනු ලබන්නේ නම් වහාම කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කිරීමට රාජ්‍ය දැව සංස්ථාව විසින් නිසි පියවර ගත යුතු අතර නීති විරෝධි ගස් හෙලීම පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය නීතිමය පියවර ගත යුතුය.

2.4 ආරණ්‍ය සේනාසන වලට බෙදා දෙන ලද/ දෙනු ලබන ඉඩම්වල ඇති ගස් එම ඉඩම් බෙදාදීමට පෙර හෝ පසු හෝ කිසිම අවස්ථාවක ඉවත් කිරීම නොකළ යුතුය.

2.5 අළුතින් ඉඩම් බෙදාදීමේදී එම ඉඩම තුල වානිජමය වටිනාකමින් යුත් සෑම ගසක්ම රාජ්‍ය දැව සංස්ථාව විසින් ඉවත් කරගන්නා බවට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු හා එම ආයතන නියෝජනය කරන ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් වග බලා ගත යුතුය.

## 03. රජය විසින් අළුතින් ඉඩම් බෙදා දීමෙන් පසු එම ඉඩම්වල ගස් කැපීම.

3.1 රාජ්‍ය දැව සංස්ථාව විසින් ගස් ඉවත්කර ගැනීමෙන් පසුව ඉඩමේ ඇති වානිජමය වටිනාකමක් නොමැති ගස් අන්සතු කළ දින සිට මුල් අවුරුදු තුන තුළ යෝජිත සංවර්ධන කාර්යයකට (පදිංචිය සඳහා නිවසක් ඉදිකිරීම හැර) එම ගස් අවහිර වන නිසා ඉවත් කිරීමට සිදුවන අවස්ථාවන් හිදී නිත්‍යානුකූල බලපත්‍රකරුට එම ගස්වල ස්ථානීය අගය ගෙවා කපා ඉවත් කර ගැනීමට අවසර දීමට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර

ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු ට බලය පැවරේ.

3.2 බෙදා දීමට පෙර, ඉඩමේ ස්වභාවික ලෙස වැඩී තිබූ වානිජමය වටිනාකමක් නොමැති ගස් හෝ බදුකරු විසින් වවාගත් ගස්, ඉඩම බෙදා දී අවුරුදු 03 ක් ගත වූ පසු එම ඉඩම් තුලම නිවසක්/ ගොඩනැගිල්ලක් අළුතින් ඉදිකිරීම සඳහා හෝ අළුත්වැඩියා කිරීම සඳහා කපා ගැනීමට අවසර ඉල්ලා සිටි විට නියත වශයෙන්ම එවැනි නිවසක්/ගොඩනැගිල්ලක් ඉදිකිරීමට/ අළුත්වැඩියා කිරීමට සුදානම් බව ග්‍රාම නිලධාරී හෝ ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී/ඒකක කළමනාකරු තහවුරු කළහොත් හා නව ඉදිකිරීමක් වන විට එම නිවසේ වර්ග ප්‍රමාණය වර්ග අඩි. 1200 කට වඩා අඩු වන්නේ නම් පමණක් ඊට අවශ්‍ය දැව ප්‍රමාණය සලකා බලා උපරිමය ඝන මීටර් 7 දක්වා නොමිලයේ කපාගෙන ඉඩම තුළ ප්‍රයෝජනයට ගැනීමට නිත්‍යානුකූල බලපත්‍ර කරුට අවසර දීමට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට බලය පැවරේ. අළුතින් ඉදිකරන නිවසේ වර්ග ප්‍රමාණය වර්ග අඩි.1200 ඉක්මවන්නේ නම් එම නිවසට අවශ්‍ය දැව ප්‍රමාණය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා කපා ගැනීමට අනුමැතිය දෙන දැව ප්‍රමාණය නව ඉදිකිරීමක් වූ විට උපරිමය ඝන මීටර් 10 ද, අළුත්වැඩියා කිරීමක් වන විට ඝන මීටර් 2 ද නොඉක්ම විය යුතුය. එකී දැව භාවිතා කොට යෝජිත ගොඩනැගිල්ල නිම කල බවට පසු විපරම් මඟින් ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් තහවුරු කර ගත යුතුය.

3.3 බෙදා දෙන ලද මඩ/කුඹුරු ඉඩමක එසේ බෙදා දීමට පෙර ස්වභාවයෙන්ම වැවී තිබුණු ගස් ඉහත 3.2 ඡේදයේ සඳහන් අවශ්‍යතා සඳහා එම සීමාව තුල කපා ගැනීමට ඉඩ දිය හැකිය. ගොඩ ඉඩම් කට්ටිය දක්වා එම දැව ප්‍රවාහනය කිරීම සිදුවන්නේ නම් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ දී ඊට අදාල චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය.

3.4 බෙදා දෙන ලද ඉඩමේ වැටට කම්බි කණු එම ඉඩමෙන් කපා ගැනීමට අවසර ඉල්ලා සිටිනවිට වැටේ දිග හා අවශ්‍ය කණු පිළිබඳව ග්‍රාම නිලධාරී හෝ ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී/ඒකක කළමනාකරුගේ සහතිකය මත නොමිලයේ කපා ගැනීමට නිත්‍යානුකූල බලපත්‍රකරුට අවසර දීමට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට බලය පැවරේ. එකී දැව එම කාර්යය සඳහා පමණක් යොදාගත් බව අදාල නිලධාරියා විසින් තහවුරු කළ යුතුය.

3.5 රජය විසින් දැනට බෙදා දී ඇති අවරුදු 15ක් කල් පිරී නොමැති බලපත්‍රයක් සහිත ඉඩමක, එසේ බෙදා දීමට පෙර ස්වාභාවිකව වැවී තිබුණු හෝ රජය විසින් වවන ලද ගස් ඉඩම බෙදා දී අවුරුදු 5 කට පසුව ඉහත 3.2, 3.3 හා 3.4 ඡේදයන්හි සඳහන් නොකරන ලද අවශ්‍යතාවයක් සඳහා කපා ගැනීමට අවසර ඉල්ලා සිටි විට ස්ථානීය අගය ගෙවා එම ගස් කපාගැනීමට

නිත්‍යානුකූල බලපත්‍රකරුට අවසර දීමට ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට බලය පැවරේ. එසේම පාරිසරික හානිය අවම කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ලිඛිතව ලබාදිය යුතු අතර එම කොන්දේසි නිසිපරිදි ඉටු කර තිබේදැයි ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් තහවුරු කර ගතයුතුය.

3.6 රජයේ ඉඩම් ආඥාපනත යටතේ යම්කිසි ආයතනයක් වෙත හෝ පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට රජයේ ඉඩමක් බදු දී ඇති අවස්ථාවකදී (වාර්ෂික බලපත්‍ර නොවන) එම බදු බලපත්‍රයට අවු. 15ක් සම්පූර්ණ වී ඇති විට හා එම ගස් වවාගත් (රෝපිත ගස්) ගස් බවට ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් සෑහීමකට පත් වේ නම් පරිසරයට හානියක් නොවන පරිදි නිත්‍යානුකූල බදුකරුට නොමිලයේ කපා ගැනීම සඳහා අවසර ලබාදීමට ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට බලය පැවරේ.

3.6.1. ඉල්ලුම් කරන ගස් බදුකරු විසින්ම වවාගත් ඒවා දැයි තීරණය කිරීමේදී ශාක විශේෂය (ගසේ වර්ගය) වයස් සීමාව හා වට ප්‍රමාණය සැලකිල්ලට ගත යුතුවේ. මෙම කරුණු නිගමනය කල නොහැකි අවස්ථාවල අඩවි වන නිලධාරිගේ නිර්දේශය ලබාගත යුතුය.

3.6.2. අවු. 15ක් කල්පිරී නොමැති බදුකරයක් සහිත බෙදා දෙන ලද ඉඩමක, බදුකරු බදුකරයේ කාලසීමාවට වඩා කාලයක් එම ඉඩම භුක්ති විඳි ඇති බව ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් තහවුරු කරන්නේ නම් බදුකරු විසින්ම වවාගත් අවු. 15කට වඩා වැඩි වයසක් ඇති ගස් කැපීම සඳහා අවසර ලබාදීමට ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට බලය පැවරේ.

එසේම පාරිසරික හානිය අවම කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ලිඛිතව ලබාදිය යුතු අතර එම කොන්දේසි නිසිපරිදි ඉටු කර තිබේදැයි ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා

මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් තහවුරු කර ගතයුතුය. කපා ගැනීමට අවසර දීමට ප්‍රථම අදාල ගස් වල වයස පිළිබඳව අඩවි වන නිලධාරිගේ සහතිකයක් ලබා තිබිය යුතු වේ.

3.7 මෙම ඉඩම් වලින් ගස් කැපීමට බලපත්‍ර නිකුත් කිරීමේ දී යුකැලිප්ටස් විශේෂ හා ඇල්ස්ටෝනියා (හවරි නුග) විශේෂ හැර වෙනත් ගස් වල වට මීටර් 0.75 (වට අඩි 2 1/2) කට අඩු නොවිය යුතුය. යුකැලිප්ටස් විශේෂ හා ඇල්ස්ටෝනියා (හවරි නුග) ගස්වල වට මීටර් 1.05 (වට අඩි 3 1/2) කට අඩු නොවිය යුතුය.

3.8 මේ කුමන ඉඩමක වුවද කොස්, දෙල් හෝ ගැහැණු තල් ගසක් හෙලීමට අවශ්‍ය අවස්ථාවලදී ගස් හෙලීම් (පාලන) පනත යටතේ විධිවිධාන හා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනතේ ආරක්ෂිත ශාක සම්බන්ධයෙන් වූ විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය.

3.9 ඉහත 3.1 සිට 3.5 දක්වා ඡේද යටතේ ගස් කැපීමට අවසරදීමේ දිනය, ගස් සංඛ්‍යාව හා කැපීමට අවශ්‍ය හේතුව ද ඉඩම් ලෙජරයේ සටහන් කර අත්සන් යෙදිය යුතුය. 3.6 ඡේදය යටතේ ගස් කැපීම පිළිබඳ විස්තර බදු ලිපිගොනු වලට ඇතුලත් විය යුතුය.

3.10 රජයේ වන වගාවකට හෝ රජයේ කැලෑවකට හෝ රජයේ වෙනත් ඉඩමකට සමීපව හෝ යාබදව පිහිටි ඉඩම් කට්ටිවල ඇති ගස් ඉවත් කිරීම සඳහා බලපත්‍ර දීමේදී ඉතාමත්ම සුපරීක්ෂාකාරි විය යුතු අතර රජයට අයත් ඉඩම්වල ගස් කපා ඉවත් කිරීම සිදු නොවන බවට පෞද්ගලිකව ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වග බලා ගත යුතුය.

3.11 ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ වූ බලපත්‍ර හෝ විවිධ රජයේ ආයතන වෙත නිදහස් කර ඇති ඉඩමක ජීවිත හා දේපල වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති ගස් ඉවත් කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක අදාල ගස් ඉවත් කිරීම පිළිබඳව රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දිය යුතු අතර දින 30ක් ඇතුලත එම ගස/ගස් ඉවත් කිරීම රාජ්‍ය දැව සංස්ථාව විසින් සිදුකලයුතුය. එසේ කිරීමට සංස්ථාව අපොහොසත් වන විටදී, එනම් දින 30ක කාලය ඉක්ම ගිය පසු, ඒ බව රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති වෙත ලිපියක් මගින් දන්වා වෙන්දේසියේ විකිණීමට ප්‍රාදේශිය ලේකම්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් පියවර ගතයුතුය.

3.11.1 මේ සඳහා අවම ලංසුව ස්ථානීය අගය විය යුතු අතර මෙම වෙන්දේසි සිදු කලයුත්තේ ප්‍රාදේශිය ලේකම්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් විසින් පමණි. එමෙන්ම, වෙන්දේසි කිරීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබාදිය යුතු අතර එම දැන්වීම් ප්‍රසිද්ධ කල බවට සෑහීමට පත්විය යුතුය.

3.11.2 එසේ වුවද එම ඉඩමේ බලපත්‍රලාභියා මිලදී ගැනීමට කැමති අවස්ථාවක ස්ථානීය අගය අය කරමින් කෙලින්ම බලපත්‍රකරුට විකිණිය හැකිය.

3.11.3 දැව ඉවත් කිරීම සිදුකිරීමට පෙර ඉවත් කරන පුද්ගලයා/ආයතනය, ඉවත් කරන්නේ කුමන ගස් වර්ග හා කොපමණ ප්‍රමාණයන්ද යන්න පිළිබඳව අදාල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි වන කාර්යාලය වෙත හා රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාලය වෙත දැනුම් දීම කල යුතු අතර දැව ඉවත් කිරීමේදී ඒ සඳහා දැනට පවතින ක්‍රමවේදය අනුව දැව ප්‍රවාහන බලපත්‍ර ලබාගත යුතුවේ.

3.12 රජය අනුමත කළ විශේෂ ආයෝජන ව්‍යාපෘති යටතේ ස්වාභාවික කැළය ආරක්ෂා කරමින් සංචාරක හෝ වෙනත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බදු ගෙන ඇති ඉඩම්වල කිසිදු ගසක් කැපීමට අවසර නොදිය යුතුය. එසේ වුවද, ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තාවේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යෝජනාවක් ඇතිවිට ඊට අවශ්‍ය අවම ගස් ප්‍රමාණය ඉවත් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හා පරිසර නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක නිර්දේශය මත අවසර දීමට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට හැකිය. එසේ ඉවත් කරනු ලබන ගස් රාජ්‍ය දැව සංස්ථාවට භාර දිය යුතුය.

## 4. <u>ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008/4 චක්‍රලේඛය අනුව ඉඩම් කච්චේරි මඟින් බෙදා දුන් හෝ බෙදා දීමට නියමිත අනවසරකරුවන් පදිංචිව සිටින ඉඩම් වල දැව ඉවත් කිරීම</u>

4.1 එවැනි ඉඩමක් සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවේදී එම ඉඩමේ පිහිටි ස්වාභාවික ගස් හා රජය විසින් වවන ලද ගස් ඉවත් කර ගැනීමට නොහැකි වන්නට පුළුවන. එසේම අනවසරකරු වැවූ ගස්ද තිබෙන්නට පුළුවන. එකී ඉඩමේ තිබෙන ස්වාභාවික ගස් හා රජය විසින් වවන ලද ගස් සම්බන්ධයෙන් වර්ගය හා ප්‍රමාණය ඇතුලත් ලැයිස්තුවක් ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී/ඒකක කළමනාකරු/ ග්‍රාම නිලධාරී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හා පරිසර නිලධාරියෙකු ගෙන් සමන්විත කමිටුවක් මඟින් සකස් කොට ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත භාරදිය යුතුය.

4.2 අනවසරයෙන් පදිංචිව සිටින ඉඩමක් සඳහා බලපත්‍ර ලබන අවස්ථාවේදී ඉඩමේ පැවැති ස්වාභාවික ගස්, රජය විසින් වවන ලද ගස් හා අනවසරකරු විසින් වවන ලද ගස් අයත්වන්නේ රජයටය. එමනිසා අදාල ඉඩමට බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර 4.1 ඡේදයේ උපදෙස් දී ඇති පරිදි මෙම ඉඩම් සඳහාද ගස් පිළිබඳ ලේඛණයක් පිළියෙළ කර එම ලේඛණය බලපත්‍රයට හා ලෙජරයට ඇතුලත් කොට එම ගස් නිසි බලධාරියාගේ අවසරයක් නොමැතිව කපා ඉවත් නොකළ යුතු බවට කොන්දේසියක් බලපත්‍රයට ඇතුලත් කළයුතුය.

4.3 4.1 යටතේ වන බලපත්‍රයක් සහිත ඉඩමක බලපත්‍රකරු ඉඩම අන්සතු කර, එම ඉඩම්ලාභියා මුල් අවුරුදු 3 ඇතුලත ඉඩමේ සංවර්ධන කටයුත්තක් සඳහා ස්වාභාවික හෝ රජය විසින් වවන ලද ගස් ඉවත් කිරීමට ඉල්ලා සිටිනු ලැබුවහොත් ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් එම දැව පළමුව ලබාදිය යුත්තේ රාජ්‍ය දැව සංස්ථාව වෙතය. රාජ්‍ය දැව සංස්ථාව එම ගස්වල ස්ථානීය අගය අයකරමින් අදාල බලපත්‍රකරුටම විකිණිය හැකිය.

4.4 4.1 යටතේ වන බලපත්‍රයක් සහිත ඉඩමක් බෙදා දී මුල් අවුරුදු 3 ඇතුලත බලපත්‍රකරු විසින් වැවූ ගස් ඉඩමේ සංවර්ධන කටයුත්තක් සඳහා ඉවත් කිරීමට බලපත්‍රකරු ඉල්ලා සිටින අවස්ථාවක ඒ බවට සෑහීමකට පත්වන්නේ නම් ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් මෙම චක්‍රලේඛයේ තුන් වන වගන්තියේ 3.1, 3.2, 3.3, 3.4, 3.5 වගන්තිය අනුව ක්‍රියාකල යුතුය.

4.5 4.1 යටතේ වන බලපත්‍රයක් සහිත ඉඩමකට දීමනා පත්‍රයක් නිකුත් කරන අවස්ථාව වන විටත් ඉඩමේ පිහිටි ස්වාභාවික ගස් හා රජය විසින් වවන ලද ගස් තව දුරටත් අදාල ඉඩමෙන් ඉවත් කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් එම සියළු ගස්වල ස්ථානීය අගය බලපත්‍රකරුගෙන් අයකර ඉන්පසු දීමනා පත්‍රය නිකුත් කල යුතුය. එසේ අයකල මුදල් පිළිබඳ විස්තරයක් ලෙජරයට ඇතුලත් කල යුතුය.

4.6 බලපත්‍රකරු ඉඩම සඳහා දීමනා පත්‍රයක් ලබාගැනීමට පෙර එවැනි සියළු ස්වාභාවික හා රජය විසින් වවන ලද ගස් මිලදී ගැනීමට හෝ ඉවත් කිරීමට අකමැත්තේ නම් 4.2 ඡේදය යටතේ බලපත්‍රයට ඇතුලත් කරන ලද කොන්දේසිය දීමනා පත්‍රයට ඇතුලත් කල යුතුය.

4.7 ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008/4 චක්‍රලේඛය අනුව මෙවැනි ඉඩමක් බෙදාදී ඇත්තේ රජයේ ඉඩම් ආඥා පනත යටතේ නම් නිකුත් කරන දීර්ඝ කාලීන බදුකරයට 4.1 ඡේදය අනුව ගස් ලැයිස්තුව පිළියෙල කර එම ගස් පිළිබඳ ලේඛණය හා කොන්දේසි දීර්ඝ කාලීන බදුකරයට ඇතුලත් කල යුතුය.

4.8 දීර්ඝ කාලීන බදුකරයක් සහිත ඉඩමක වලංගු බදු කාලය තුල බදුකරු විසින් ඉඩමේ පිහිටි ස්වාභාවික හෝ රජය විසින් වවන ලද ගස් හෝ බදුකරු විසින් වවන ලද ගස් ඉඩමේ සංවර්ධන කාර්යයක් සඳහා ඉවත් කිරීමට ඉල්ලීමක් කලහොත් 4.3 ඡේදය අනුව හෝ 4.4 ඡේදයේ උපදෙස් අනුව එම දැව ඉවත් කිරීමට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුට අවසර දිය හැකිය.

4.9 දැව හෙලීම් සිදුකරන අවස්ථාවේදී එවැනි ඉඩම්වල මුළු ගස් ප්‍රමාණයෙන් 40% ක් ඉතිරිව තිබිය යුතු අතර ඒ පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු, පරිසර නිලධාරියෙකු සහ ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී/ග්‍රාම නිලධාරී/ක්ෂේත්‍ර උපදේශක ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් තීරණය කල යුතුය

## 5. වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා ගස් ඉවත්කිරීමට සිදුවීම

5.1 වෙනත් සංවර්ධන කටයුතු (උදා. විදුලි රැහැන් ඇදීම, මාර්ග සංවර්ධනය කිරීම වැනි රජයේ විශේෂ සංවර්ධන කටයුතු) සඳහා අන්සතු කරන ලද ඉඩමක ගස් ඉවත් කරන්නට සිදුවූ විට ඉහත විධි විධාන යටතේ කට්ටිකරු වවා ගත් බවට පිළිගත හැකි ගස්වල දැව හැර අනිකුත් දැව ඉවත් කර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට උපදෙස් දිය යුතුය.

## 6. මධ්‍යම පන්තික යෝජනා ක්‍රමය යටතේ බෙදා දී ඇති ඉඩම්වල ඇති ගස් කැපීම

6.1 මධ්‍යම පන්තික යෝජනා ක්‍රමය යටතේ බෙදා දී ඇති ඉඩම් අතර කෘෂි, වාණිජ වගා සඳහා බෙදා දී ඇති ඉඩම් තිබෙන බැවින් එවැනි ඉඩම්වල සංවර්ධන කාර්‍යයන් සඳහා ගස් ඉවත් කිරීමට සිදුවුවහොත් පහත පරිදි ක්‍රියා කළ හැකිය.

6.1.1 එවැනි ඉඩමක් බලපත්‍රයක් මත ලබාදී ඇති අවස්ථාවකදී එහි ගස් ඉවත් කිරීම සඳහා අවසර දිය යුත්තේ 3 වන ඡේදයේ 3.1 - 3.11 දක්වා ලබාදී ඇති උපදෙස් අනුවය.

6.1.2 එවැනි ඉඩමක් සඳහා දීමනා පත්‍රයක් ලබා දී ඇති අවස්ථාවකදී 13.1 වගන්තිය අනුව ක්‍රියා කළ හැකිය.

## 7. සීමිත (තහනම්) වර්ගවල දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම

7.1 මෙම කුමන ඉඩමක වුවද සීමිත (තහනම්) වර්ග වල දැව වන කළුවර, කළුමැදිරිය, බුරුත, හුලංහික්, පලු, සූරියමාර (හූරිමාර), ගම්මාලු, හල්මිල්ල, මිල්ල, වෙලන්, පානක්කා, කුඹුක්, කොහොඹ සහ මී යන වර්ග දාහතර වෙනුවෙන් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමට සිදුවන විට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ දැව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම යටතේ සීමිත (තහනම්) වර්ග වල දැව පිළිබඳව අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලවය.

## 8. විවිධ ආයතන භාරයේ පවතින රක්ෂිත වල / ඉඩම් වල ගස් ඉවත් කිරීම

8.1 දුම්රිය දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇතුළුව අදාල පනත් යටතේ පැවරීමේ නියෝගයකින් රජය විසින් යම් ඉඩමක සම්පූර්ණ අයිතිය පවරා දෙනු ලැබූ ආයතන හැර අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන යටතේ පවත්නා රක්ෂිත වල හා ඉඩම් වල ඇති ගස් කැපීමට සිදුවන්නේ නම් අදාළ ආයතනයේ ඉල්ලීමක් හෝ එකගතාවය ලද පසු ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් එම ගස් කපා ඉවත්කර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට උපදෙස් දිය යුතුය. එවැනි ගස්, ඉවත් කිරීමේ ක්‍රියාවලිය රක්ෂිතය හෝ ඉඩම භාර ආයතනයේ අධීක්ෂණය යටතේ ඉටු කළ යුතුය.

8.1.1 එවැනි රක්ෂිතයක හෝ ඉඩමක හෝ ගස් කපා ඉවත් කිරීමට සිදුවී ඇති බව මුලින්ම පෙනී ගියේ ප්‍රාදේශීය ලේකම්වරයාට නම්, ඔහු ඒ බව අදාළ ආයතනයට දැනුම් දී ඉහත 8.1 යටතේ ඇති විධි විධාන අනුව ක්‍රියා කළ යුතුය.

8.1.2 හදිසි ආපදාවකදී ඇති වූ අවහිරයක් ඉවත් කිරීම සඳහා ගස් කැපීමට සිදුවුවහොත් ප්‍රාදේශීය ලේකම් විසින් හෝ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ රක්ෂිතය හෝ ඉඩම භාර ආයතනය විසින් හෝ වහාම ගස කපා අවහිරය ඉවත් කර ඉතා කඩිනමින් අන්‍යෝන්‍ය වශයෙන් දැනුම්දීමට පියවර ගත යුතුය.

8.1.3 8.1.2 යටතේ හදිසි ආපදාවකදී මාර්ගයට බාධා වන සේ ගසක් ඇදවැටී ඇති විටෙක වහාම එම ගස් මාර්ගයෙන් පසෙකට ඉවත් කිරීම සඳහා වන සංරක්ෂණ නිලධාරීන්ට කඩිනමින් පැමිණිය නොහැකි විටෙක ප්‍රාදේශීය ලේකම්වරයා හෝ මාර්ග සංවර්ධන අධිකාරිය ඊට මැදිහත් වී කටයුතු කරන අවස්ථාවකදී හැරුණු විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ පවත්නා ඉඩම් වල ඇති ගස් කැපීම කරනුයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පමණි.

## 9. ප්‍රාදේශිය වැවිලි සමාගම් වලට අයත් ඉඩම් වල දැව හෙළීම

**9.1** ප්‍රාදේශිය වැවිලි සමාගම්වලට බදුදී ඇති ඉඩම්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩම් අදාල ආයතන අතර අත්සන් කරන ලද බදු ගිවිසුම් ප්‍රකාර, වාණිජ වන වගාවන් කර ඇති අවස්ථාවලදී එම ගස් ඉවත් කිරීම පිළිබඳව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ විශේෂ වැඩ පිළිවෙලක් අනුගමනය කළයුතුය.

**9.2** ප්‍රාදේශිය වැවිලි සමාගම්වලට බදු දී ඇති ඉඩම්වල ගස් ඉවත් කිරීමේදී එය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදුකර, එලෙස ඉවත් කිරීමට නිර්දේශිත ගස් පිළිබඳ සවිස්තර වාර්තාවක් දිස්ත්‍රික් පාරිසරික හා වන ආරක්ෂක කමිටුව වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතුය.

## 10. රාජ්‍ය සංස්ථා මණ්ඩල (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හැර) අධිකාරි හා ව්‍යවස්ථාපිත ආයතන සතු ඉඩම්වල දැව හෙළීම

### 10.1 රජය විසින් ලබා දී ඇති ඉඩම් වල දැව හෙළීම හා ඉවත් කිරීම

**10.1.1** එම ඉඩම ඒ ඒ ව්‍යවස්ථාපිත ආයතනවල නීති රීති යටතේ ඉඩම් අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය මත ගැසට් නිවේදනයක් මඟින් පවරාගෙන ඇති ඉඩමක් නම් එම ඉඩම් ලබාදෙන අවස්ථාවේ තිබු ගස් ඉවත් කිරීමට අවශ්‍ය වු විට එම දැව රාජ්‍ය දැව සංස්ථාවට භාරදිය යුතුය. එවැනි ඉඩම් වල ආයතනය විසින් වවන ලද ගස් ඇත්නම් ඒවා අදාල ආයතනයේ නීති රීති යටතේ හෙළීමට ක්‍රියා කල හැකිය.

10.1.2 එම ඉඩම අතිගරු ජනාධිපතිතුමන්ගේ අත්සන යටතේ නිකුත් කළ ප්‍රදාන පත්‍රයක් හෝ පැවරුම් නියෝගයක් මගින් බැහැර කර ඇති අවස්ථාවක එම ඉඩමේ පිහිටි ගස් හෙළීම හා ඉවත් කිරීම අදාළ ආයතනයේ නීතිරීති අනුව සිදු කළ හැකිය. කෙසේ වෙතත් පරිසර හානිය අවම කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

10.1.3 රජය විසින් ඉඩම් ලබා දී ඇතත් මේ වන තෙක් කිසිදු නෛතික අයිතියක් ලබාගෙන නැති දේපළවල පිහිටි ස්වාභාවික ලෙස වැවී ඇති ගස් ඉවත් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක ඒවා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාරදිය යුතුය. එවැනි ඉඩම්වල අදාල ආයතනය විසින් වවන ලද ගස් ඇත්නම් එහි ස්ථානීය අගය ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත ගෙවා දැව හෙළීම හා බැහැර කිරීම කළ හැකිය.

## 10.2 ව්‍යවස්ථාපිත ආයතන විසින් මිළදී ගෙන ඇති පුද්ගලික ඉඩම්

10.2.1 ඒ ඒ ආයතන එම ආයතනයේ අරමුදල් මගින් මිළදී ගෙන ඇති දේපලවල පිහිටි ගස් ඒ ඒ ආයතනවල නීති රීති යටතේ ඉවත් කිරීමට ක්‍රියා කළ හැකිය. මෙවැනි දැව ප්‍රවාහනය කිරීමට අවසර පත්‍ර ලබා ගැනීමට එම ආයතන විසින් තම දේපළවල අයිතිවාසිකම් පිළිබඳ ලේඛන අදාල බලධාරීන්ට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

## 11. <u>පාවී එන දැව හා ගංගා ඇළ දොළ සිදීමෙන් මතුවන දැව හා අරටු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම</u>

11.1 ගංගා, ඇලදොළ හා මුහුදේ පාවී එන දැව හා ගංගා ඇළදොළ සිඳීමෙන් මතුවන දැව හා අරටු පිළිබඳ ග්‍රාම නිලධාරී/ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී/ඒකක කළමනාකරු විසින් වහාම ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දිය යුතු වන අතර, එම දැව හා අරටු සම්බන්ධයෙන් වන ආඥා පණතේ 6 වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුවේ.

## 12. <u>ගස් හෙළීම් ලේඛණය</u>

12.1 අන්සතු කළ රජයේ ඉඩම්වල හා අනෙකුත් රජයේ ඉඩම්වල ඉහත සඳහන් පරිදි ගස් හෙළීම ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ වගකීම යටතේ සිදුවිය යුතු අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී පරීක්ෂා කළහැකි පරිදි පහත සඳහන් විස්තර දැක්වෙන ලේඛණයක් ඔවුන්ගේ කාර්යාලවල පවත්වාගෙන යා යුතුය.

| අනු අංකය | යොමු අංකය හා දිනය | ග්‍රාම නිලධාරී වසම | ඉඩම් කට්ටියේ බලපත්‍ර අංකය හෝ රක්ෂිතයේ/ ඉඩමේ ලොට් අංකය | කට්ටිකරුගේ හෝ රක්ෂිතය/ඉඩම භාර ආයතනයේ නම | ගස් පිළිබඳ විස්තර (වර්ගය උස හා වට ප්‍රමාණය) | කැපීමට හේතුවන කාරණය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

**13. <u>දීමනා පත්‍ර සහ දීර්ඝ කාලීන බදු මත ලබා දී ඇති ඉඩම් වල පිහිටි ගස්</u>**

13.1 ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හෝ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ අන්සතු කළ රජයේ ඉඩමක් සඳහා අදාළවන පරිදි, දීමනා පත්‍රයක්, නියාදන සාධන පත්‍රයක් හෝ දීර්ඝ කාලීන බදුකරයක් ලබාගෙන තිබේ නම් එවැනි ඉඩම් වලින් දැව ඉවත් කිරීම, මෙම චක්‍රලේඛයේ සඳහන් සීමාවන්ට යටත්ව සින්නක්කර ඉඩම් වලින් දැව ඉවත් කිරීමක් සේ සලකා ක්‍රියා කළ යුතු වන්නේය.

13.2 එසේ වුව ද මැණුම්පතිවරයාගේ ව්‍යවස්ථාපිත පිඹුරක් නොමැතිව නිකුත් කර ඇති ජයභූමි දීමනාපත්‍ර ඉඩම් වල දැව ඉවත් කර ගැනීම සඳහා අවසර දීමට පෙර ජාතික මැණුම් ජාලයට සම්බන්ධ කරමින් බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් පිළියෙල කරන ලද මැණුම් පිඹුරක් ලබාගෙන අදාළ ඉඩමේ මායිම් නිශ්චය කර ගත යුතුය. සෑම පිඹුරක්ම ජාතික මැණුම් ජාලයට සම්බන්ධ කර මැන ඇති බවට ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු සෑහීමකට පත්විය යුතු අතර එසේ නොවන පිඹුරක් මේ සඳහා ප්‍රතික්ෂේප කිරීම කළ යුතුය.

13.3 යම් ජයභූමි දීමනා පත්‍රයක සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් කට්ටිකරු විසින් භුක්ති විඳින අවස්ථාවකදී බලයලත් මිනින්දෝරු විසින් මැණුම් පිඹුර පිළියෙළ කළ යුත්තේ එසේ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය සඳහා පමණි.

13.4 එසේම ජයභූමි දීමනා පත්‍රයක සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳින අවස්ථාවකදී (මායිම් කෙසේ සඳහන් කර තිබුණේ වුව ද) මැණුම් පිඹුර සකස් කළ යුත්තේ දීමනා පත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණය සඳහා පමණි. ඉතිරි ප්‍රමාණය ඔහුට නීත්‍යානුකූලව ප්‍රදානය කර නොමැති රජයේ ඉඩම් ප්‍රමාණයක් සේ සළකා ක්‍රියා කළ හැකි අතර එහි ඇති දැව, රජයේ දැව ලෙස සලකා හෙළීමට අවසර නොදිය යුතුය.

**14 <u>වෙනත්</u>**

14.1 මෙම චක්‍රලේඛයේ විධිවිධාන සඳහා ස්ථානීය වටිනාකම ලබා ගත යුත්තේ රාජ්‍ය දැව සංස්ථාව වෙතිනි.

14.2 ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු ගේ උපදෙස් මත රාජ්‍ය දැව සංස්ථාව ලවා ඉවත් කර ගනු ලබන දැව පිළිබඳ විස්තර ඔවුන් විසින් එම සංස්ථාව වෙතින් ලබා ගත යුතුය. එම විස්තර වහාම එම නිලධාරීන් වෙත යැවීමට රාජ්‍ය දැව සංස්ථාව ද ක්‍රියා කළ යුතුය.

14.3 මෙම චක්‍රලේඛය යටතේ කපා හෙලනු ලබන දැව හෙලු ස්ථානයෙන් බැහැරට ප්‍රවාහනය කිරීමට සිදුවන විට දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඊට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන පරිදි කළ යුතුය.

14.4 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වගා කරන ලද ඉඩමක හැර රජය සතු වෙනත් ඉඩම් වල දැව ඉවත් කිරීමේදී පහත සඳහන් තොරතුරු අන්තර්ගත ලේඛණයක් රාජ්‍ය දැව සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතුය

- ඉවත් කිරීම සඳහා සලකුණු කරන ලද ගස් සංඛ්‍යාව, වර්ගය හා දල උස
- ඉවත් කරන ලද ගස් සංඛ්‍යාව, වර්ගය හා ඉවත් කරන ලද දැව පිළිබඳ විස්තර
- හෙලීම් නොකර ඉතිරි කරන ලද ගස් සංඛ්‍යාව, වර්ගය, දල උස, පපු මට්ටමේ වට හා ඉවත් නොකරන ලද හේතුව
- ලද රාජ්‍ය ආදායම්
- භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාග අගය

තවද එකී තොරතුරු ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත මාසිකව දන්වා යැවිය යුතුය

14.5 දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හෝ ත්‍රිවිධ හමුදාව විසින් බදු දෙන ලද ඉඩම්වල ගස් ඉවත්කිරීමේදී මෙම චක්‍රලේඛයේ 2 හා 3 ඡේදයන්වල උපදෙස් අනුව ක්‍රියාකලයුතුය.

14.6 වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන අභයභූමි තුල පිහිටි පුද්ගලික ඉඩම් හෝ රජය විසින් දීමනාපත්‍රයක් හෝ දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් ලබා දී ඇති ඉඩම්වල දැව හෙලීමේදී වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.

14.7 දැනටමත් බෙදා දී ඇති ඉඩම්වල, පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම සලකා අංශක 30 ට වැඩි බෑවුම් සහිත ඉඩම්වල හා නායයෑමට ඉඩ ඇතැයි ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) විසින් නම් කර ඇති ප්‍රදේශ වලත් පාංශු සංරක්ෂණ පණත යටතේ නම් කර ඇති ප්‍රදේශවලත් පිහිටි ඉඩම් වල ගස් කැපීම සඳහා බලපත්‍ර නිකුත් නොකළ යුතුය.

14.8 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ගැසට් කරනු ලැබූ ප්‍රදේශ තුලට පමණක් නේවාසික ව්‍යාපාර කළමනාකරු / ඒකක කළමනාකරුට මෙම චක්‍රලේඛයේ සඳහන් බලතල සීමාවේ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අදාල බල ප්‍රදේශවල පරිපාලන කටයුතු ප්‍රාදේශීය ලේකම්ගේ පාලනයට ආපසු භාර දී ඇති අවස්ථාවල මෙම චක්‍රලේඛයේ බලතල ප්‍රාදේශීය ලේකම්ට පැවරේ.

14.9 මෙම චක්‍රලේඛයේ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් සහ සහකාර ඉඩම් කොමසාරිස් යන තනතුර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන අන්තර් පළාත් ගොවි ජනපද සඳහා පත් කර ඇති නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් තනතුරු වලට පමණක් අදාල වේ. මෙවැනි බල ප්‍රදේශවල ඉඩම් රාජකාරි ප්‍රාදේශීය ලේකම් ගේ පාලනය යටතේ ක්‍රියාත්මක වන අවස්ථාවක මෙම චක්‍රලේඛයේ බලතල ප්‍රාදේශිය ලේකම්ට පැවරේ.

**15. <u>දැව හෙළීමකදී සිදුවිය යුතු පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය</u>**

15.1 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ විධිවිධාන හා එහි සංශෝධනයන් ප්‍රකාරව දැව හෙළීම් කළ යුතුය.

**16.** මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිවය.

**17.** මෙම චක්‍රලේඛය පිළිබඳව වැඩිමනත් විස්තර ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවකදී පහත නිලධාරීන් ඇමතිය හැකිය.

| | | |
|---|---|---|
| **(i)** | අතිරේක ලේකම් (ස්වාභාවික සම්පත්) | - දු. අංකය: 011-2868072 |
| **(ii)** | අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත්) | - දු. අංකය: 011-2877287 |

**ආර් එ- එස් සමරතුංග**
ලේකම්
පරිසර අමාත්‍යාංශය

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. සියළුම අමාත්‍යාංශ ලේකම්වරු

} දැන ගැනීම සඳහා

6. පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු ) අවශ්‍ය කටයුතු සඳහා
7. විගණකාධිපති )විගණන කටයුතු වලදී මෙම විෂය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම සඳහා

8. යුධ හමුදාපති
9. ගුවන් හමුදාපති
10. නාවික හමුදාපති
11. පොලිස්පති
12. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
13. මිනුම්පති
14. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්
15. දුම්රිය සාමාන්‍යාධිකාරි
16. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
17. පළාත් ආණ්ඩුකාර ලේකම්වරු
18. පළාත් සභාවල අමාත්‍යාංශ ලේකම්වරු
19. සභාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරිය
20. සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය
21. සභාපති නාගරික සංවර්ධන අධිකාරිය
22. පළාත් ඉඩම් කොමසාරිස්වරු
23. දිසා වන නිලධාරීවරු

} අවශ්‍ය කටයුතු සඳහා